# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.04.03 පැය 1745 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/634/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**පොලිස් භාරයේ සිටියදී රෝහල් ගත කරන ලද සැකකරුවෙකු මියයාම - වැලිකඩ පොලිස් ස්ථානය.**

2025.04.01 වන දින රාත්‍රී කාලයේ වැලිකඩ පොලිස් වසමේ නාවල ප්‍රදේශයේ නිවසකට පුද්ගලයෙකු ඇතුළු වී සිටින බවට වැලිකඩ පොලිසියට ලද තොරතුරක් අනුව වැලිකඩ පොලිස් ස්ථානයේ නිලධාරින් කණ්ඩායමක් විසින් එම ස්ථානයට ගොස් විමශර්න ආරම්භ කර ඇත.

පොලිස් නිලධාරින් එම නිවසට ඇතුල් වූ පුද්ගලයාගෙන් ප්‍රශ්න කිරීමේදී ඔහු යම් මානසික ආබාධයකින් පෙළෙන පුද්ගලයෙකු බවට නිරීක්ෂණය වන ආකාරයෙන් හැසිරීම හේතුවෙන් මෙම අයගේ ආරක්ෂාව සඳහා වහාම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත. පොලිස් ස්ථානයේදී මෙම පුද්ගලයා කලහකාරී ලෙස හැසිරෙමින් සිර මැදිරිය ආශ්‍රීතව බිත්තියේ ඔහුගේ ශරීරයේ කොටස් වද්දා ගනිමින් නිලධාරීන්ට පාලනය කර ගැනීමට නොහැකි වන ආකාරයට හැසිරී ඇත. ඒ අනුව නිලධාරීන් විසින් මහත් පරිශ්‍රමයක් දරා මෙම සැකකරු මුල්ලේරියාව මානසික රෝහල වෙත ඇතුළත් කර ඇත.

මෙම සැකකරු රෝහලේ ප්‍රතිකාර ලබමින් සිට පසුදින අළුයම් කාලයේදී මිය ගොස් ඇති අතර මෘත දේහය සම්බන්ධයෙන් පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කිරීමට නියමිතය.

**මරණකරු වයස අවුරුදු 26 ක් වන පහල ගෙදර, මීගහකිවුල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙසේ පොලිස් භාරයේ සිටි සැකකරුවෙකු රෝහල් ගත කිරීමේදී මියයාම සම්බන්ධයෙන් විමශර්න කිරිම සඳහා නුගේගොඩ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාගේ උපදෙස් මත නුගේගොඩ කොට්ඨාස අපරාධ විමශර්න කාර්යංශය මගින් විමශර්නයක් ආරම්භ කර ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**